# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1444 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 18/11/2023<br>පැය 2020 |

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තැබීමක් - ගාල්ල පොලිස් වසම.**

2023.11.18 වන අද දින දහවල් කාලයේදී ගාල්ල පොලිස් වසමේ දඩල්ල ප්‍රදේශයේ පිහිටි හෝටලයක් ඉදිරිපිටදී ත්‍රිරෝද රථයකින් පැමිණ සිටි පුද්ගලයෙකු ඉලක්ක කරමින් වැගන් ආර් වර්ගයේ මෝටර් රථයකින් පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු විසින් වෙඩි තැබීමක් සිදුකල බවට ගාල්ල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

දඩල්ල ප්‍රදේශයේ පිහිටි හෝටලයක සිටින විදේශීය ජාතිකයින් දෙදෙනෙකු රැගෙන එන ලෙසට වෙනත් පුද්ගලයෙකු විසින් ලබාදෙන ලද දුරකතන ඇමතුමක් මත ත්‍රිරෝද රථයේ රියදුරු හා ඔහුගේ පුතා එම ස්ථානයට පැමිණ සිටියදී මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවට දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර, මෝටර් රථයෙන් පැමිණි පුද්ගලයින් විසින් තබන ලද වෙඩි පහරින් කිසිවෙකුටත් තුවාල සිදුව නොමැත.

වෙඩි තැබීම සඳහා පැමිණි වැගන් ආර් වර්ගයේ මෝටර් රථය හබරාදූව පොලිස් වසමේ බෝගහගොඩ ප්‍රදේශයේ තිබියදී ගාල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මගින් සොයාගෙන ඇති අතර, සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ගාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**